සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved



# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

**12 ශ්‍රේණිය** | **බෞද්ධ ශිෂ්ටාචාරය** | **පිළිතුරු පත්‍රය**

## I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (2) | 02. (2) | 03. (2) | 04. (5) | 05. (3) | 06. (3) | 07. (4) | 08. (5) | 09. (4) | 10. (1) |
| 11. (2) | 12. (2) | 13. (4) | 14. (2) | 15. (5) | 16. (4) | 17. (3) | 18. (4) | 19. (2) | 20. (3) |
| 21. (3) | 22. (5) | 23. (1) | 24. (3) | 25. (2) | 26. (5) | 27. (2) | 28. (2) | 29. (5) | 30. (4) |
| 31. (1) | 32. (4) | 33. (2) | 34. (4) | 35. (5) | 36. (4) | 37. (3) | 38. (2) | 39. (4) | 40. (1) |
| 41. (3) | 42. (5) | 43. (3) | 44. (1) | 45. (5) | 46. (4) | 47. (5) | 48. (1) | 49. (2) | 50. (4) |

(ලකුණු 2x50 = 100)

## II පත්‍රය

(එක් ප්‍රශ්නයකට ලකුණු 20 ක් දෙන්න.)

01. (i) ඒකමේවතු ශුද්‍රසස ප්‍රභූඃ කර්ම සාමදිසන්
ඒතේෂා මේව වර්ණානාං සූ ශුද්‍රසං මනු සුසයා (මනුස්මෘතිය 191 ශ්ලෝකය)

ශුද්‍ර වංශිකයන්ට නියමිතව පැවතියේ එකම කාය්‍යීයකි. එනම් දාසභාවයයි. බ්‍රාහ්මණ, ක්‍ෂත්‍රිය, හා වෛශ්‍ය යන කුලවතුන් උදෙසා උපතේ සිට විපත දක්වාම බැලමෙහෙකම් කිරීමයි. මේ අනුව රටට අවශ්‍ය ශ්‍රමදායී පිරිස ලෙසින් ශුද්‍රවංශිකයන් යොදා ගෙන තිබුණ බව මින් පෙනේ.

(ii) ජීවිතයේ අවසාන කාලයේ මුළුමනින්ම කාම භෝගිත්වයෙන් දුරු වී හුදකලාව ආගමික ජීවිතයක් ගත කිරීම, යෝගී භාවනා කරමින් බ්‍රහ්ම සහවාස්‍යතාව අපේක්ෂාවෙන් තවුස්දම් පිරීම සිදු කළ යුතුය. (''ඕම්'' කාර භාවනාව)

(iii)
- ★ සාමාජ විකාශනයේ ප්‍රතිඵලයක් ලෙස චතුර්වර්ණය බිහිවූ බව දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් වේ.
- ★ සමාජයේ අවශ්‍යතා මත මහජන සම්මතයෙන් රජු තෝරා පත් කර ගත් අතර ඔහු කෙත්වලට අධිපති බැවින් (ඛෙත්තානං අධිපතීති බො වාසෙට්ඨා ඛත්තියෝ) ක්‍ෂත්‍රිය නමින් ද,
- ★ සදාචාර විරෝධී ක්‍රියා පිළිකුල් කොට ලාමක අකුසල ධර්‍මයන් බැහැර කළ පිරිස් (පාපිකෙ අකුසලෙ ධම්මේ බාහෙන්තීති බො පා සෙට්ඨො බ්‍රාහ්මණෝ) බ්‍රාහ්මණ නමින්ද,
- ★ මෙවුන්දම් සේවනය කරමින්, ගව පාලනාදී විවිධ කර්මාන්ත වල නියතු වූවෝ (මේථුනං ධම්මං සමාදාය මිස්සුතං කම්මන්තෙ පයෝජෙන්තීති බො මා සෙට්ඨො මෙස්සා'') වෛශ්‍ය නමින් ද,
- ★ සොරමැරකම් වංචාදී අපරාධ යන්හි නියතු වූ සදාචාර විරෝධී පිරිස් (ඵද්දාචාරා බුද්දුචාරාති බො මාසෙට්ඨො සුද්දා) ශුද්‍ර නමින් ද ව්‍යවහාරයට පැමිණ තිබේ.

(iv) ඍග්වේදය, යජුර්වේදය, ස්‍යාවස් වේදය, අථර්මන් වේදය, මනුස්මෘතිය.

- කාන්තාවට පැවිදි වීමේ අයිතිය හිමිකර දීම,: මහාප්‍රජාපති ගෝතමී, ඛේමා, උප්පලවන්නා, පටාචාරා වැනි කාන්තාවන් භික්‍ෂුණී සාසනයේ පැවිදි වී අග්‍රස්ථානයට පත්වීම.
- විශාඛා, ඛුජ්ජුත්තරා, නකුල මාතා වැනි කාන්තාවන්ට උපාසිකාවන් ලෙස විශේෂ ආගමික වරප්‍රසාද තනතුරු ලබා දීම.
- භික්‍ෂු භික්‍ෂුණී උභය පක්ෂයටම සමා අයිතිවාසිකම් හිමිව තිබීම.
- පිරිමි පක්ෂයට මෙන්ම කාන්තාවන්ට ද සමාන ලෙස ආගමික කටයුතු වල නියැලීමට අවකාශ තිබීම.

02. (i) නත්ථි දින්නං නත්ථි යිට්ඨං .... ආදී වශයෙන් දසවස්තුක මිථ්‍යාදෘෂ්ටියක් ඉදිරිපත් කිරීම.

(1)දුන්දෙයෙහි විපාක නැත. (2)යාගයෙහි විපාක නැත. (3)හෝමයෙහි විපාක නැත. (4)හොඳ නරක ක්‍රියාවල විපාක නැත. (5) මෙලොවක් නැත. (6) පරලොවක් නැත. (7) මවක් නැත. (8) පියෙක් නැත (9) ඕපපාතික සත්වයෝ නැත. (10) සත්‍ය දැනගත් ශ්‍රමණ, බ්‍රාහ්මණයෝ නැත. මීට අමතරව භෞතිකවාදී ඉගැන්වීම් ඉදිරිපත් කිරීම. එනම් සතරමහා භූතයන්ගෙන් සකස් වී ඇති සත්වයා මළ පසු එම සතරමහා භූත

කොටස් බාහිර ලෝකයේ ඇති සතරමහා භූත සමග එක්වෙයි. ශරීරය ආදාහනය කළ පසු සියල්ල අවසන් වේ.

(ii)
- දසවස්තුක මිත්‍යා දෘෂ්ටිය පිළි ගැනීමෙන් සදාචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාව නැතිවී යන බැවින් මෙම ඉගැන්වීම බුදුදහම ප්‍රතික්ෂේප කරයි.
- මොහුගේ මෙම ඉගැන්වීම් සමාජය තුළ සදාචාර ධර්මයන්ගේ පරිහානියට රුකුලක් බව බුදුදහම අවධාරණය කරයි.
- නාස්තිකවාදය මගින් සමාජ සුචරිතය විනාශ වන බව අවධාරණය කරයි.
- දසවස්තුක මිත්‍යා දෘෂ්ටිය ප්‍රතික්ෂේප කරන බුදු සමය ''අත්ථිදින්නං ආදී වශයෙන් දසවස්තුක සම්මාදිට්ඨියක් පෙන්වා දෙයි.

(iii)
- නිර්මාණ වාදී දේවසංකල්පය බැහැර කිරීම.
- නිදහස් චින්තනය ඇගයීම
- අත්තකිලමතානු යෝගී පිළිවෙත් හඳුන්වා දීම
- නව විමුක්ති මාර්ගයක් සොයා යාම.
- කාන්තාවට ආගමික නිදහස ලබාදීම
- අනගාරික ජීවන ප්‍රතිපදාව
- ඥානමාර්ගය ගරු කිරීම.
- ත්‍රිවේදය බැහැර කිරීම
- චින්තන විප්ලවයක් ඇති කිරීම
- යාගය ප්‍රතික්ෂේප කිරීම
- අල්පේච්ඡතාව සුකරතාව අගය කිරීම.
- සංචාරක ජීවිතය

(iv)
- පාරිභෝගික භාණ්ඩ හුවමාරු ක්‍රමය ඇතිවී මුදල් භාජනයට ක්‍රමයෙන් හුරුවීම
- භාරතයේ දේශීය මාර්ග පද්ධතිය දියුණු වී ජාත්‍යන්තර මාර්ග හා බද්ධ වීම.
- සිටුවරු නමින් ධනපති පංතියක් බිහිවීම
- විනෝදාස්වාදය ගෙන දෙන සැනකෙළි පැවැත්වීම.
- බැංකු කටයුතු සිදුවීම.
- වෙළඳ නගර නිර්මාණය වීම.
- සුරාසැල් ගණිකා මඩම් බිහිවීම.

(v) උතුරින් නේපාලය ද දකුණින් සුන්දරිකා නදිය ද බටහිරින් ගුම්ති නදිය ද නැගෙනහිරින් ගණ්ඩක් නදිය ද සීමාකොට යොදුන් තිස්දෙකක් ප්‍රමාණයක විහිදුණු රාජ්‍යය කෝසලයයි.
- සියලු සම්පතින් පිරුණු යන අරුත් ඇති ශ්‍රාවස්තිය මෙහි අගනුවරයි.
- කෝසල රාජ පරම්පරාව එහි පාලකයන්ය.
- බුදුන්වහන්සේ 19 වසරක් වැඩසිටි ජේතවනාරාමය, සය වසරක් වැඩ සිටි පූර්වාරාමය, රාජිකාරාමය යන ප්‍රධාන බෞද්ධ ආරාම පිහිටා තිබීම. සාකේත, සේතව්‍ය, කේස පුත්ත, නගර අයත් වීම.

03. (i)
- තාපස ජීවිතයක් සඳහා වනගත වීම, අරමුණයි.
- වයසට ගියපසු දේපල දරුවන්ට පවරා දී කැමැතිනම් භාර්යාව සමග වනගත වීම.
- යෝගී ජීවියක් ගත කිරීම. (කරුණු පැහැදිලි කර තිබිය යුතුයි.)

(ii)
- වේදයුගයෙහි කාන්තාවට හිමිව තිබූ නිදහස නැතිව ගොස් මුළු මහත් ජීවිත කාලය තුළදීම පුරුෂාධිපත්‍යයට යටත් වීම.
- සතිපූජාව පැවැත්වීම.
- ආගමික සාමාජික ආර්ථික කාර්යයන්ට සහභාගි වීමට අවස්ථාව නොලැබීම.
- වැන්දඹුවක් වශයෙන් ගැහැට විඳීමට සිදුවීම.
- පුතකු බිහි කිරීම අනිවාර්ය වීම.

(iii) (1) බ්‍රාහ්මණ නිර්මාණ වාදය. (2) යාගහෝම බිලි පූජා. (3) වර්ණධර්ම ආශ්‍රම ධර්ම, සහධර්ම, ආපද්ධර්ම,
(4) කාන්තාවගේ තත්වය පහත හෙළීම. (5) ආත්මවාදය (පරමාත්ම ජීවාත්ම) (6) උදකපාරිශුද්ධි යනා දී කරුණු බුදුරදුන්ගේ විචාරයට ලක්කළ බව ප්‍රමාණාත්මකව දක්වා තිබිය යුතුයි.

(iv) පූර්ණ කස්සප මක්ඛලි ගෝසාල අජිත කේසකම්බල හා පකුධ කච්චායන අකිරිය වාදීන් වූ නිසා කර්ම සිද්ධාන්තය ප්‍රතික්ෂේප කළ අතර නිගණ්ඨනාත පුත්ත පුබ්බේ කත හේතුවාදය හා අවිහිංසා ධර්මය අනුගමනය කිරීම තුළින් ජලය වාතය හා පැළෑටි වලට ද ප්‍රාණය ඇතැයි ප්‍රකාශ කරමින් දඩිවකර්මවාදී වීම හා සංජය බෙල්ලට්ඨි පුත්ත කර්මය සැකයට භාජනය කළ බව විස්තර කර තිබීම ප්‍රමාණවත් ය.

(v) අග්ගඤ්ඤ සූත්‍රයේ එන මතය ගෙන හැර දැක්වීම ප්‍රමාණවත්ය.

04. (i) සර්ව බල ශක්ති සම්පන්න ඊශ්වර කෙනෙක් ස්වකීය ශක්තියෙන් ලෝකයද, සත්වයා ද නිර්මාණය කෙරෙයි යනු වෛදිකයන් තුළ තිබූ නිර්මාණවාදී අදහසයි. ඒ අනුව පුද්ගලයාගේ ආගමික, සාමාජික, අධ්‍යාපනික,

දේශපාලනික ආදී හැම අවස්ථාවක දීම නිදහස සීමාකරමින් වර්ණධර්ම ආශ්‍රම ධර්ම ආදිය තුළ මිනිසා කොටුකර තැබීම, නිදහසේ සිතාමතා ක්‍රියාකිරීමට අවස්ථාවක් නොදීම ආදී කරුණු පිළිතුරට ඇතුළත් විය යුතුය.

(ii)
- භෞතිකවාදයෙන් මැවුම්වාදය, මැවුම් කරුවකු නැතිබව පෙන්වීම
- කර්මවාදයෙන් යාග, හෝම, පුදපූජා ප්‍රතික්ෂේප කිරීම.
- නියතිපරිණාම වාදයෙන් මිනිසාට දෛවයෙන් විනා කිසිවක් කළ නොහැකි බව ඉගැන්වීම.
- අකිරිය වාදයෙන් පින්පව් සියල්ල ප්‍රතික්ෂේප කිරීම.
- නිශ්චිත පිළිගැනීම් කිසිවක් අනුමත නොකළ අපරාවික්ඛේපවාදය, වැනි ඉගැන්වීම් වලින් බ්‍රාහ්මණ සංස්කෘතිය පිටුදැකීම ශක්තියක් ඇතිවීම.

(iii)
- නියති වාදයෙන් පැවසෙන්නේ ලොව සියල්ල වැළකිය නොහැකි නියත රටාවක් අනුව සිදු වන බවයි.
- ෂට් ශාස්තෘන් අතර මක්ඛලිගෝසාල ''නියති සංගීති භාවපරිණාතා'' යනුවෙන් කිසිම උත්සාහයකින් තොරව ඉබේම විමුක්තිය ලැබේය යන කියමන නිරර්ථක පදනම් විරහිත හානිකර දර්ශනයක් ලෙස බුදුන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ.
- පුද්ගලයා සතු නිර්මාණ ශක්තිය පුරුෂ වීර්ය හා බල පරාක්‍රමය අනුව සමාධීනත්වයක් ඇති පුද්ගලයන් බව බුදු දහම පිළිගනී.

(iv)
- කෙත්වලට අධිපති වූ බැවින් (ඛෙත්තානං අධිපතිති ඛත්තියෝ) ක්ෂත්‍රිය නමින්ද
- පාපකර්ම බැහැර කිරීමට උත්සුක වූ බැවින් ''............ බාහිත පාපෝති බ්‍රාහ්මණෝ'' පව් බැහැර කරන අදහසින් ''බ්‍රාහ්මණෝ'' නමින් ද
- ''...........විසුං විසුං කම්මන්තේ පයෝජෙන් තිති මෙස්සා''......... විසුං කර්මාන්ත හෙවත් විවිධ වූ කර්මාන්ත එනම් ධනෝපායන මාර්ග වූ ගොවිතැන, වෙළදාම, සත්වපාලනය, මුදල් පොළී කිරීම වැනි කාර්යන්හි නියැළුනු නිසා ''වෛශ්‍ය'' නමින් ද ● බුද්ද ලුද්ද සමාචාරා සුද්දා'' රළු පැවැතුම්, පහත් කර්මාන්ත එනම් අපරාධ හොරමැර කම් වංචා ආදී දුසිරිත්හි නියැළුණු අය ''ශුද්‍ර'' යන පහත් නාමයෙන්ද හැඳින්වේ.

මෙසේ චතුර්වර්ණය ප්‍රභවය වී පරිණාමය වූ බැව් ''අග්ගඤ්ඤ'' සූත්‍රයෙහි සඳහන් වේ.

05. (i) බුද්ධකාලීන භාරතය ජනපද දහසයකට බෙදී තිබූ බව (සොළොස්මහා ජනපද) බෞද්ධ සාහිත්‍යයෙන් අනාවරණය වේ.

- ජනපද පාලන ක්‍රමය තුළ මත්ස්‍ය න්‍යාය ක්‍රියාත්මක වීමත්, ඒ අනුව දුර්වල පාලකයන් පරදවා කාර්යශූර, දක්ෂ රණශූර පාලනයක් ප්‍රබලවීම හා බුද්ධ කාලය වන විට මගධ, කෝසල, මත්ස, අවන්ති යනුවෙන් ප්‍රබල රාජ්‍ය හතරක් බිහිවීම, මේවා රාජාණ්ඩු වීම,
- රාජාණ්ඩු ක්‍රමයට අමතරව ගෝත්‍ර ප්‍රධානීන්ගේ සාමූහිකත්වයෙන් ජනපද කිහිපයක් පාලනය විය. ගණ තන්ත්‍ර පාලන ක්‍රමයට පාලනය වූ රාජ්‍ය අතර මජ්ජි, මල්ල, ජනපද ප්‍රධාන වේ.

(ii)
- හැමවිටම පුරුෂයාම පණ්ඩිත නොවේ. ස්ත්‍රීහුද පණ්ඩිත වෙති. ''ඉත්ථීසි ඒකච්චියා සෙය්‍යා............'' ඇතැම් ස්ත්‍රීහු ශ්‍රේෂ්ඨය. එමනිසා ස්ත්‍රිය පෝෂණය කළ යුතු බව.
- සිවුවනක් පිරිස අතර ද භික්ෂුණී හා උපාසිකා දෙපිරිසක් සිටී.
- ''ඉත්ථීභාවෝ නො කිංකයිරා''..... මනාකොට පිහිටුවා ගත් සිත් ඇති ඥාණවන්තව ක්‍රියාකරන මනාකොට ධර්මය දන්නා ස්ත්‍රිය ශ්‍රේෂ්ඨය.
- බුද්ධි සංවර්ධන ක්‍රියාවලියේදී ස්ත්‍රී පුරුෂ සමානත්වය
- ස්ත්‍රී ප්‍රඥාව දැගුල් ප්‍රඥාව යන මත ප්‍රතික්ෂේප කරමින් ඥාණමාර්ගය හඳුන්වා දීම.
- වයස් සීමාවකින් තොරව ආර්ය බ්‍රහ්මචාර්යාව අනුගමනය කළ හැකි බව.
- නිදහස් චින්තනය ඇගයීම.
- අග්ගි පාරිසුද්ධිය උදකපාරිසුද්ධිය ප්‍රතික්ෂේප කිරීම.
- කාන්තා නිදහස අගය කිරීම.

(iv)
- පූර්ණ කස්සපගේ අකිරියවාදය භෞතික සමරූපයක් ගනී.
- මක්ඛලි ගෝසාලගේ නියති සංගතිය සංසාර ශුද්ධිවාදය භෞතික පරිණාම වාදයකි
- පකුධ කච්චායන ශාස්මත භෞතික වාදියාය, භෞතික පදාර්ථ සතක සදාතනික පැවැත්මක් ඔහු පිළිගනියි.

- අජිත කේශකම්බල උච්ඡේද භෞතික වාදියාය. පරම නාස්ති වාදය ඉගැන්වූ ඔහු සුඛපරම වාදය දැඩිව පිළිගනියි.
- නිගණ්ඨනාත පුත්ත භෞතික කර්මවාදියාය, ආත්මයත්, කර්මබීජයනුත් කර්මක්ෂය කිරීමේ උපක්‍රමයනුත් අවසාන ආත්ම පාරිසුද්ධියෙන් ලබන කෙවල්‍යයයත් භෞතික ස්වරූපයක් ගනී. කායදණ්ඩය ප්‍රබලය. මනෝ දණ්ඩය දුර්වලය. බාහිර භෞතිකය මිස අධ්‍යාත්මික ශක්තියක් නොපිළිගනී.

06. (i) දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ සමාජ ප්‍රභවය හා පරිණාමය පිළිබඳ කරුණු විස්තරවීම, ප්‍රමාණවත්ය.

(ii) ක්‍රි. පූ. 6 සියවසේ භාරතීය සමාජය ධනෝපායනයේදී කෘෂි කර්මාන්තය, සත්ව පාලනය, විවිධ ගෘහස්ථ කර්මාන්ත රාජ්‍ය සේවය මෙන්ම, වාණිජ්‍යය හෙවත් වෙළඳාම ද ප්‍රධාන මාධ්‍ය ලෙස භාවිත කෙරෙණි.

- බුද්ධ කාලීනව මගධ, කෝසල, මත්ස, අවන්ති යන මහාරාජ්‍ය බිහිවීමත් සමඟ ශ්‍රාවස්ති රජගහ, සාකේත කෝසම්බි, බාරාණසී යන නගර මහනගර ලෙස නිර්මාණය වීම.
- මථුරා චම්පා, වේසාලී උජ්ජයිනී ආදිය ද නාගරික පරිසරයක පැවතීම.
- රාජ්‍යයන් අතර හා ජනකොටස් අතර පැවති නිරන්තර යුද ගැටුම් නිසා වාණිජ්‍ය නිශ්පාදන සඳහා ඉල්ලුම වැඩිවීම.

(iii) උපාසිකාවක, මවක, දියණියක හා ගෘහණියක, බිරිඳක, භික්ෂුණියක වශයෙන් කාන්තාවක ගේ අභිමානය සුරැකීමෙහි ලා බුදුසමය උනන්දුවක් දක්වා ඇති ආකාරය මූලාශ්‍ර වලින් තහවුරු වීම.

- විමුක්ති සාධනයේ දී ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව දක්වා තිබීම.
- බුදුරජුන් පවා මහා ප්‍රජාපතී ගෝතමිය තම මව ලෙස සලකා සම්මානනයට ලක් කිරීම

(iv) ජටිල, ආජීවක, අචේලක, නිගණ්ඨ, ආදී නම් වලින් හඳුන්වනු ලැබූ ශ්‍රමණ කණ්ඩායම් කිහිපයක් සිටීම, ජටායර සංචාරක පැවිද්දෝ, ජටිලනම් වූහ. දිවි පැවැත්ම උදෙසා කිසියම් ව්‍රතයක පිහිටි පැවිද්දෝ ආජීවකයෝය. තමන කෙලෙස් ගැට වලින් තොරයයි කියාගත් පැවිද්දෝ නිගණ්ඨයෝය. ගැඹුරු දාර්ශනික ප්‍රශ්න කර පින්නා ගත් සංචාරක පැවිද්දෝ පරිබ්‍රාජකයෝය.

- සෑම කුලයකම අය මෙම ශ්‍රමණ කණ්ඩායම් අතර විසූහ. ශ්‍රමණ සම්ප්‍රදාය ගොඩ නැගීමෙහි ප්‍රමුඛ වූවෝ ක්ෂත්‍රියයෝය.

07. (i) සමාජමය ආධිපත්‍යය : වර්ණභේදය මගින් බ්‍රාහ්මණ කුලය උසස්ම කුලය ලෙස හුවා දැක්වීම

- වර්ණධර්ම ලෝහනිර්මාණය හා සම්බන්ධ කිරීම, • සමාජයේ වැඩිම ගෞරවයට පාත්‍රවිය හැකි කාර්යයන් තමන්වෙත පවරා ගැනීම, • ඉගැන්වීමේ කාර්ය තමන් යටතට ගැනීමෙන් ඔවුන්ගේ ආකල්ප සමාජය තුළට කාවැද්දීම. • ආශ්‍රම ධර්ම මගින් පුද්ගල ජීවිතය පාලනය කිරීම.

දේශපාලනික ආධිපත්‍යය : රජුන් අභිෂේක කිරීම බ්‍රාහ්මණයන් විසින් සිදු කිරීම, • රජුගේ පුරෝහිත තනතුර හිමිකර ගැනීම. පුරෝහිතයාගේ උපදෙස් මත රජු රට පාලනය කළ යුතු වීම. බ්‍රාහ්මණයකුට කිසිම වරදකට ශාරීරික දඬුවම් දියනොහැකිය. කළ හැක්කේ ශිඛාව කැපීම හෝ රටින් පිටුවහල් කිරීමය.

(ii)
- නිර්වාණාවබෝධයට ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව බුද්ධ ශාසනය තුළින් ඔප්පු වීම.
- අධිගම ලැබීම අතින් ස්ත්‍රිය හා පුරුෂයා අතර වෙනසක් නැති බව බුදුන්වහන්සේ පිළිගැනීම. උදා: උප්පලවණ්නා තෙරණියගේ සෘද්ධිමත් භාවය, • සකුලා තෙරණියගේ දිව්‍යැස් මහිමය.
- කාන්තාවන්ට බුදු සසුනේ පැවිද්ද උරුමවීම මෙන්ම පුරුෂයන්ට මෙන්ම කාන්තාවන්ට ශාසනයේ අග තනතුරු හිමිවීම.
- ස්වාමි පුරුෂයා අන්ස්ත්‍රීන් කරා යාම පිරිහීමේ හේතුවක් ලෙස පෙන්වා දීමෙන් ස්ත්‍රීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂාවීම.

(iii)
- බහුදේව පාදයෙන් ඒක දේවපාදයට පරිවර්තනය වීමෙන් පසු යාගය අතිවිශාල ධනස්කන්ධයක් වැය කළ යුතු එකක් වීම නිසා පොදු ජනතාවට යාග කළ නොහැකි තත්වයක් උදාවීම.
- මේ නිසා බමුණන් ආර්ථික අතින් පිරිහීම නිසා ස්වධර්මයෙන් බැහැර විවිධ රැකියාවන්හි නිරත වීම.
- ක්ෂත්‍රියයන් බ්‍රාහ්මණයන් කෙරෙහි විරුද්ධ වීම
- යාගකිරීම වෙනුවට බොහෝ දෙනෙකු යෝගයන් හි යෙදීමට පෙළඹීම.
- යාග කිරීමෙන් ලැබිය නොහැකි ප්‍රඥාව හා ඥාණය තවුස් දමින් ලැබිය හැකිවීම.
- මහා රාජ්‍යයන් පහළ වීම නිසා වැඩි බලයක් හිමි වූ ක්ෂත්‍රිය රජවරුන්ගේ සහාය බ්‍රාහ්මණයින්ට නොව ශ්‍රමණයන්ට හිමිවීම.

(iv) • වෛදික යුගයේ සීමිත භාණ්ඩ හුවමාරු ක්‍රමයක් පැවතීම.
- වෛශ්‍යකුලයේ අය වෙළඳාමේ නියැලීම
- පශ්චාත් වෛදික යුගයේ දී මුදල් විෂයෙහි අවධානය වැඩවීම.

- එතෙක් ඉඩම් හා ගවයන් හිමි ප්‍රභු ආධිපත්‍යය රන්කාසි බලයට යටත්විය. ජේතවන කුමාරයාගේ කතාව නිදසුනකි.
- බ්‍රාහ්මණයන්ද ස්වධර්මයෙන් බැහැරවී මුදල් උපයන වෘත්තීන්හි යෙදීම.
- පටපිළි, හැඳි, පිහියා, වටිනා ඇඳුම්, ගෙත්තම්, පලස්, සුවඳ බෙහෙත් ද්‍රව්‍ය ආදිය ප්‍රධාන වෙළඳ ද්‍රව්‍ය වීම.
- කහවනු වලින් භාණ්ඩ වල මිල නියම කිරීම.
- වෙළඳාම් කිරීමේ දී විවිධ සම කපටකම් කළ බව තුලාකූට මානකූට ආදිය පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන්වීම.
- මාර්ගයේදී සොරසතුරන්ගෙන් වෙළඳුන්ට කිසියම් අලාභයක් සිදුවිනි නම් ඒවා ගෙවීම සඳහා අහින පාල නම් නිලධාරියකු විසින් බද්දක් අයකිරීම.

08. (i) අතිරියවාදියෙකි. නිත්‍යපදාර්ථවාදීය. වෙනස් නොවන ස්ථිර නිශ්චල කිසිවක් නූපදවන කිසිවකු විසින් නොකරවන ලද සමූහ හතක් දක්වා තිබීම. එනම්, (1) පඨවි (2) ආපෝ (3) තේජෝ (4) වායෝ (5) සැප (6) දුක (7) ප්‍රාණය

- තියුණු ආයුධයකින් හිස සිඳීම යනු ජීවිතක්ෂයට පත්කිරීමෙන් නොවේ. මෙය සප්ත කායයන් අතරින් ආයුධයක් ඇතුළත් කිරීම පමණකි.
- බුද්ධ ඝෝෂ හිමියන් මොහු හඳුන්වා ඇත්තේ ''නිස්සිරික ලද්ධි'' යන නමිනි.

(ii) මොහුගේ ධර්මය සංසයවාදයකි. ආඳකු මෙන් ප්‍රශ්නවලින් ලිස්සා යන බැවින් අමරා වික්ඛේපවාදී නම් වේ. කිසිම ප්‍රශ්නයකට පැහැදිලි ස්ථිර පිළිතුරක් නොදේ. ඔහුගේ ධර්මය පිළිබඳව ආසත් රජුට ප්‍රකාශ කර ඇත්තේ මෙසේය. ''පරලොවක් ඇද්දැයි මගෙන් ඇසුවිට පරලොවක් ඇතැයි මට සිතුනොත් පරලොවක් ඇතිය කියමි. එහෙත් මට එසේ නොසිතේ. එසේ නොවේ යයිද නොසිතේ. පරලොවක් නැද්දැයි මගෙන් ඇසුවිට පරලොවක් නැහැයි මට සිතුනොත් පරලොවක් නැතැයි මම කියමි. එහෙත් මට එසේ නොසිතේ. එසේ නොවේ යයිද නොසිතේ. වෙනත් අන්දමට ද නොසිතේ. (සාමඤ්ඤ ඵල සූත්‍රය) මොහු ප්‍රශ්නයකට සතර ආකාරයකින් පිළිතුරු දී ඇත. එනම්, (1) ඇත. (2) නැත (3) ඇත මෙන්ම නැත. (4) ඇත්තේ ද නැත නැත්තේ ද නැත. පරලොවක් ඇද්ද? සත්වයන් මැරී උපදීද හොඳ නරක ක්‍රියාවල ඵලවිපාක තිබේද? තථාගතයන් මරණින් මතු වේද? යන ප්‍රශ්නවලට සංජය පිළිතුරු දී නැත.

(iii) (i) ස්වාමියාට පති භක්තියෙන් යුතුව ජීවත්විම

(ii) දරුවන් තැනීම (විශේෂයෙන් පුතුන්)

(iii) නිවසේ කටයුතු නිසි පරිදි කිරීම

(iv) සියලු කටයුතු ස්වාමියාගේ කැමැත්ත අනුව සිදු කිරීම

(v) පුරුෂයකු යටතේ ජීවත්වීම, ආදී කරුණු වලින් 03 ක් වත් විස්තර වී තිබීම ප්‍රමාණවත්ය

(iv) ''ඛෙත්තානං අධිපතිති ඛත්තියෝ'' • කෘෂි කර්මාන්තය රජුට පැවරී තිබූ කාර්යයක් බව.

- රජු සහභාගිවන වැදගත් උත්සවයක් ලෙස ''වප්මඟුල'' සිදු කිරීම.
- කෘෂිකර්මාන්තයට අදාළවන වචන ඇසුරින් රජවරුන්ගේ නම් යොදා තිබීම. උදා: ඕදන යනු බත්ය සුද්ධෝදන, අමිතෝදන, ධෝතෝදන, මිතෝදන.....
- කසීභාරද්වාජ සූත්‍රය ඇසුරින් කරුණු ඉදිරිපත් කිරීම.
- කෘෂිකර්මාන්තයෙන් යැපෙන පුද්ගලයන්ට අවශ්‍ය අනෙක් ද්‍රව්‍ය කෘෂි භාණ්ඩ හුවමාරුවෙන් ලබාගත් බව (ශෂ්‍යභෝග හුවමාරුව)
- කූට දන්ත සූත්‍රයෙහි කුඹුරු සාදන ගොවීන්ට බිත්තර වී (බීජ හත්තං) රජු විසින් ලබා දිය යුතු බව
- කෘෂිභාණ්ඩ සම්පත් හිමිකරුවන් බුද්ධකාලීන සමාජයේ සිටුවරුන් වී සිටී බව.
- කෘෂිකටයුතු සඳහා අත්‍යවශ්‍ය ජලය සඳහා යුද පවා ඇතිවීම. රෝහිණී නදියේ ජලය බෙදා ගැනීමට උද්ගත වූ යුද්ධය
- භික්ෂූන්ගේ සිවුරු සැකසීමේ දී මගධ කෙත උදාහරණයට ගැනීම.